# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..



## කාලය කෙතරම් දේ වෙනස් කරයිද?

ජූනි සන්නසේ "ලේඛක ආබාධ අසනීප සහ ව්‍යාධි" මැයෙන් ඩී බී කුරුප්පු ශූරීන් ලියා තිබූ ලිපිය එක් අතකින් සතුටකුත් අනික් අතින් දුකකුත් ජනිත කරන්නට සමත් විය. සතුටක් ඇති වූයේ මා වැර වෑයමින් කළ යමකින් කුමන ආකාරයක හෝ යහපතක් සිදුවී ඇති බව කුරුප්පු ශූරීන් පෙන්වා දීම නිසාය. සැබැවින්ම ඒ ලියවිල්ල ඩී බී කුරුප්පු වැනි ප්‍රවීණ ගත් කතුවරයකුගේ නිහතමානී කම පෙන්වා දෙනවා පමණක් නොව තමන්ගේ නිර්මාණයක අඩුපාඩුවක් කිසිවකු පෙන්වා දුන් විට පරල වන, විවිධාකාර කලා ක්ෂෙත්‍ර වල නියැලී සිටිනා, ඔස්ට්‍රේලියාවාසී සිංහලයනගේ ඇස් අරවන්නටද සමත් වන ලියවිල්ලකි.

දුකක් ඇති වූයේ, කිසිවකුගේ නිර්මාණයක් අවංක ලෙස විචාරයට ලක්කරන්නට හැකි සමාජයක් ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකේය සමාජයේ ස්ථාපිතව තිබූ ඒ යුගය අවසන් වී ඇති බව වැටහෙන විට ය. අද ඇත්තේ කිසිවකුගේ කිසිම ක්‍රියාවක් විචාරයට ලක් කිරීමට අවකාශයක් නැති විකෘති නිර්මාණ ලෝකයකි. විවිධාකාර ක්ෂේත්‍ර වලට වැදී ගත් පිස්සෝ පිස්සු කෙළති. අපි මෞන ව්‍රතය රකිමින් හිත යටින් සිනාසෙමින් බලා සිටිමු.

සිය ලිපියෙන් ඩී බී කියූ කතාව මගේ දෘෂ්ඨි කෝණයෙන් මෙසේ නැවත ලියමි.

මෙයට වසර අටකට නවයකට පෙර (තවමත් තරුණයකුගේ මතකයක් ඇති ඩී බී මෙන් මතකයෙන් කාල වකවානු කියන්නට නොහැකි වීම මොන තරම් අභාග්‍යයක් ද?) දිනෙක වරුණ සාවින්ද මට දුරකතනයෙන් කතා කළේ ය. ඒ අප වරුණ හඳුනාගත් මුල් අවධියේ දිනයකි. ඩී බී කුරුප්පු මහතාගේ කෙටිකතා පොත් දෙකක් නිකුත් වන බවත් ඒවා එළි දැක්වීමේ උත්සවයේදී ඒ පොත් දෙක පිළිබඳ විචාරයක් කිරීම සඳහා මට ආරාධනා කරන්නට තීරණය

> *ගල් පිළිම වෙනුවට බොල් පිළිම බිහිවන කාලයකි මේ. විස්මයට කාරණය වන්නේ බොල් පිළිම බව දැන දැනම සමහරු ඒවා වන්දන-*

කර ඇති බවත් ඔහු දැන්වීය. මම කාරණා දෙකක් නිසා එය ප්‍රතික්ෂෙප කළෙමි. පළමුව ඩී බී වැනි දැවැන්තයකුගේ නිර්මාණ විචාරයට ලක් කරන්නට තරම් ප්‍රවීණත්වයක් මට ඇතිද යන සැකය සිතේ මතුවීමය. දෙවැන්න අවංක ලෙස මගේ අදහස් කියන්නට හැකි වාතාවරණයක් තිබේ ද යන සැකය ය. හිතට එකඟව කතා කරන්නට නොහැකි නම් එවන් තැන් වල කතා කිරීමේ තේරුමක් නැත.

මම වරුණට ඒ බව කීවෙමි. දින දෙකකට පමණ පසු හේ යළි මා ඇමතුවේ ය.

"කිසිම ප්‍රශ්නයක් නැහැ... ජගත් අයියගෙ හිතට එකඟව කතා කරන්නට කිසිම තහනමක් නැහැයි කියලා කුරුප්පු අංකල් කිව්වා.." වරුණ කීවේ ය.

මම ආරාධනාව බාර ගතිමි.

ඒ වන විට ඩී බී සමග මගේ කිසිදු ආකාරයක සම්බන්ධයක් නොවීය. අපි දැක තිබුණේ ද එක් වතාවක් පමණකි. එයද අහම්බෙන් වාගේ රවි කරව්දෙනිය හිතවතාගේ පැරඩයිස් වෙළඳශාලාවේදීය. එදාත් ඩී බී හා මා අතර වචන දෙක තුනක හෝ සංවාදයක් නොවී ය. අපි මොනවා හෝ වචනයක් දෙකක් කතා කර වෙන්ව ගියෙමු. (මේ සිදුවීම පසුගියදා පැවති මගේ පොත් එළි දැක්වීමේ දී ඩී බී නැවත සිහිපත් කළේ සිනාසෙමින් ය)

මම මගේ විචාරයට ලක් කරන්නට නියමිතව තිබු ඩී බී ගේ කෙටිකතා පොත් දෙක කීප වතාවක් කියවා සූදානම් වීමි. "කලු හිල සහ නාරාවල" පොත පිළිබඳ මගේ තිබුණ ප්‍රධාන තර්කය වූයේ එහි එන කතා අපේ සිත් වල කිසිදු ආකාරයක කම්පනයක් ඇති නොකරයි යන්නයි. ඒ බොහෝ කතා සිදුවීම් වාර්තා කිරීමක් පමණක් යයි මට සිතුණි. පාඨකයාගේ සිතේ මොනයම් ආකාරයක හෝ සංවේදනයක් ඇති නොකරන නිර්මාණ සාර්ථක නිර්මාණ නොවේය යන්න මම එදත් අදත් අදහමි.

නමුත් "විප්ලවය ආවොත්" පොතේ ආ බොහෝ කතා මගේ සතුටට හේතු විය. ඒවා සිදුවීම ගෙඩි පිටින් ලියවිලි බවට පත් කළ නිර්මාණ නොවීය. ඩී බී සතු මහා අත්දැකීම් සාගරයෙන් අහුලා ගත් අත්දැකීම් සංවේදී නිර්මාණ බවට පත් කළ ඉතා හොඳ කෙටිකතා ඒ පොතෙහි විය.

මූලාසනයේ සිටියේ උපා උපදාස හෝ බන්දු දිසානායක හෝ විය යුතුය. අභාවප්‍රාප්ත හරිස්චන්ද්‍ර ශූරීන්ද දීර්ඝ කතාවක් කළ බව ද මතකය. එය එතුමා කළ අවසන් ප්‍රසිද්ධ දේශණය විය යුතු ය.

ජගත් ජේ එදිරිසිංහ

මගේ දේශණය අවසන මම ඩී බී කුරුප්පු මහතා දෙස බැලුවෙමි. ඔහු සිනාසෙමින් සිටියේ ය. මගේ දේශණය ඔහුගේ සිතේ පහන් හැඟීමක් ඇති නොකරන බව මම දැන සිටියෙමි. එහෙත් ඔහු සිනාසෙමින් සිටියේ ය. ඒ ඔහුගේ පැසුණ බවය. පරිනත බව ය. බුද්ධිමත් බව ය.

විචාරයක් ඉවසා සිටින්නට නොහැකි කිසිවකු නිර්මාණකරණයට නොබට යුතු ය. කිසිවකු නිර්මාණයක් බිහි කර එය සමාජයට මුදා හළ පසු එය තවදුරටත් නිර්මාපකයාගේ අයිතියෙහි පවතින දෙයක් නොවේ. ඉන්පසු එය අයිතිවන්නේ එය රසවිඳින සමාජයටයි. ඒ නිර්මාණය තක්සේරු කරන්නේ ඔවුන් ය. ඒ නිර්මාණය රස විඳින්නන් තම තමන්ගේ දැනුම් මට්ටමින් රස වින්දන මට්ටමින් එය කත්සේරු කරති. ඒ විචාර පිළිගත්තා හෝ නොගත්තා හෝ තම නිර්මාණයේ හොඳ නරක වෙනුවෙන් පෙනී සිටින්නට නිර්මාණකරුවාට අයිතියක් නැත. " මම ඉතා හොඳ නිර්මාණයක් කළා.." යි කටක් ඇර කියන්නට ලැජ්ජාවක් ඇති නිර්මාණකරුවකුට හැකියාවක් නැත.

තමන්ගේ නිර්මාණයක් වෙනුවෙන් ඇසෙන ගුණත් දොසත් දෙස උපේක්ෂාවෙන් බලන්නට තරම් නිර්මාණකරුවා බුද්ධිමත් විය යුතු ය. නිහතමාණී විය යුතු ය. ලේඛණය, සංගීතය, වේදිකාව, සිනමාව. පුවත්පත, ගුවන් විදුලිය හෝ වෙන ඕනෑම කලා මාධ්‍යයක් හෝ වේවා ඒ සියල්ලට මෙය පොදුය.

"අනේ බලන්න මගේ අර තරම් හොඳ නිර්මාණය නරකයි කියල මේ මිනිස්සු කියනවනෙ.." කියන්නන් කී දෙනෙක් අද දවසේ අපට හමුවෙනවාදැයි මදක් සිතා බලන්න. තමන්ගේ නිර්මාණ විවේචනය කරන්නන්ගේ ඔලු පලා දැමීම සඳහා අවි අමෝරා ගත් මිනිසුන් ඔබට කොපමණ හමුවෙනවාදැයි මදක් සිතා බලන්න.

ගල් පිළිම වෙනුවට බොල් පිළිම බිහිවන කාලයකි මේ. විස්මයට කාරණය වන්නේ බොල් පිළිම බව දැන දැනම සමහරු ඒවා වන්දනාමාන කිරීමයි.

සියල්ල කෙතරම් වෙනස් වි ඇද්ද. සියල්ල වෙනස් වෙමින් පවතින්නේ අවපසට වීම කොයි තරම් අභාග්‍යයක් ද?


